




සිසිර දිසානායක

# හිත හිටියා - මං ආවා

''හිතයි මමයි ගමේ ගියා
හිත හිටියා - මං ආවා''

ඉක්කා වැටෙන වෙලාවට පුංචි ඈයො ඉක්කාව නවත්ත ගන්න කියන කවියට තමන්ගෙ පද දාගෙන පින්සල කියව කියවා එහාට මෙහාට ඇවිදිනවා.

''ඇත්ත තමයි කතාව'' පන් හිඳටත් හිතුණා. ඒ ගැන සටහනක් කිව්වොත් හොඳය කියලා පටන් හිතුණා. යන්න බැරි - පුළුවන් අපි හුඟක් දෙනෙක්ගෙමම හිත තියෙන්නෙ තමන් උපන්, හැදුන - වැඩුන ගම් පළාත්වල තමයි.

යුද්ධ කලබල, දේශපාලන, අවුල් වියවුල් අවිඅස්සේ තම තමන්ගේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යන අයගේ සැබෑ ප්‍රවෘත්ති දැක බලා ගන්න, අහල දැන ගන්න පුළුවන් වෙන්නේ ඒ ඒ අයත් එක්ක සතියක් හමාරක්වත් ගත කෙරෙන කොට නේද කියලා පන්ට හිතුණා. ඒත් ඒ හැම දෙයක්ම ලියන්න ගියොත් වැඩේ දිග්ගැස්සෙන හන්දා මව්බිමේ සුභ සිද්ධියට හේතුවුන විදිහේ දේවල් කීපයක් ගැන විතරක් ලියන්නය පන් හිතුවේ.

''කලකට පසු'' අනුරාධපුර ප්‍රදේශයට හදිසියෙ-න් හෝ යාමට ලැබීම සතුටට හේතුවක් විය. ගමනේදී මුලින්ම වන්දනා කිරීමට නැවතුනේ අව්කනයි. මහා වංශයට අනුව ධාතුසේන නිරිඳාණන් (ක්‍රි.ව. 459 - 477) විසින් කළ වාපි කර්මාන්තයන් දහ අටෙන් එකක් වූ කලාවැවට නුදුරුව පිහිටි අව්කන විහාරස්ථානයේ ඇති විශේෂත්වය නම් එහි නෙලා ඇති (අඩි 37.26 (මීටර් 11.36) උස් වූ හිටි පිළිමයයි. වර්ෂා කාලයේදී පිළිමයේ සිරසට වැටෙන ජලය නාසය දිගේ ගලා විත් සිරි පතුල් දෙක අතරෙහි වූ පද්මාසනයේ ලාංඡනය මත පතිත වීමට සළස්වා තිබීම නිර්මාණකරුවාගේ විශිෂ්ඨත්ව පෙන්වන්නකි. පිළිමය ආරක්ෂා කරනු වස් කලකට පෙර ඉදිකර තිබුණා වූ ආවරණය ඉවත් කර තිබීම මෙවර අප දුටු වෙනසයි. ධාතුසේන රජ දවස නිමා කළ ''කලාවාපී'' විහාරස්ථානයේ එදා මෙදා තුර අව් - වැසි සුළංවලට මුහුණ දෙමින් තමන් වහන්සේ විසින්ම රැකවරණය සළසා ගත් පිළිම වහන්සේ රැක්මට ඉදිකළ ආවරණය නිසා එහි වූ කලාත්මක බව වැනසී තිබිණ. අන් දෙයකට රැකවරණය දීමට තබා තමන්ටවත් රැකවරණය සළසා ගත නොහුණු එම ආවරණය ඉවත් කිරීම කලා හිතකාමීන්ගේ සතුටට කාරණයක් වනු නොඅනුමානයි.

අව්කන බුද්ධ ප්‍රතිමා වහන්සේගේම සේයා රුවකින් සැරසී පසුගිය වෙසක් සමයේ දොරට වැඩි අගනා බොදු ගී එකතුවක් රස විඳීමට ලැබීමද රසික හිතකාමීන්ගේ සතුටට හේතුවකි. පටු වාණිජමය හැඟීමෙන් තොරව මෙවන් ගී එකතුවක් ''සමිඳු පාමුල'' නමින් එළිදැක්වූයේ ශිල්පී වික්ටර් රත්නායකයන්ය. රසිකයිනට හුරු පුරුදු ''සමිඳු පාමුල'', ''අරුණළු ඇතිරෙන'', ''දොම්නසින් බර නිම්වලල්ලේ'', ''දෙව්රම් වෙහෙරේ'', ''නිවන් දුටු හිමි'', ''සාගර ජලය මදි'' වැනි ප්‍රේමකීර්ති අල්විස් නිබන්ධකයාණන් ලියූ ගීතත්, පුණ්‍යසිරි මහවත්තයන්ගේ ''අමා දහර'' සිනමා සක්විති ගාමිණි ෆොන්සේකා ශිල්පියාණන්ගේ ''සසර නිසරු බව'' මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ ''අනාථනාථයාණනි'' වැනි ගීතත්, නව බොදු කීපයකුත් එක්ව නිකුත් කෙරුණා වූ ගී එකතුවකි. ''සමිඳු පාමුල''. ඒකාකාරී රිද්මයන්ට වැයෙන ඝෝෂාකාරී සංගීත රටාවන්ට යටපත්ව පෞරුෂත්වයෙන් හීන හඬින් ගැයෙන ගීත වැල්වලින් හෙම්බත් වුණ රසිකයින් වෙනුවෙන් පිදුනා වූ නාමල් මාලාවකි ඒ.

අප අනුරාධපුරයට සේන්දු වනවිට සවස් වී තිබිණ. ශ්‍රී ලංකාවේ ප්‍රථම අගනගරය ලෙසින් ඓතිහාසි ගතව සියවස් දහ හතරක් තිස්සේ එකී කිරුළ පැළැඳි නගරයකි එය. අදින් වසර දෙදහස් හාරසියයකට පමණ පෙරදීය ඒ. ඒ ක්‍රි.පූ. සතරවන සියවසේදී ලංකාවේ රජ වූ පණ්ඩුකාභය රජතුමා රජ දවසේදීයි.

සිංහල බෞද්ධ සංස්කෘතිය ලොව හමුවේ විදා දැක්වූ අනුරාධපුරයේ ඇති ශ්‍රේෂ්ඨතම වස්තුව වන්නේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේයි. දෙවනපෑතිස් රජ දවස (ක්‍රි.පූ. 250) - 210) සංඝමිත්තාවන් දෝතින් වැඩම කළ උන්වහන්සේ අද ද දැඩි රැකවල් මධ්‍යයේ මහ මෙව්නාවේ ටැම් පිට වැඩහිඳින සේක.

මුරකාවල් දකින සඳ සිහිපත් වන්නේ මහින්ද චන්ද්‍රසේකරයන් අතින් ලියැවී රෝහණ වීරසිංහයන් අතින් සංගීතවත්ව දීපිකා ප්‍රියදර්ශනී විශාරදවරිය ගැයූ ''ජය සිරිමා හාමුදුරුවනේ'' ගීතයයි. ප්‍රවීණයන් පස් හය දෙනෙකුගේ පද රචනා වීරසිංහයන් අතින් සංගීතවත්ව එළිදැක්වෙන ප්‍රියදර්ශනීයගේ නවතම ගී එකතුව රසිකයිනට සතුටුදායක ආරංචියකි. ඒ මතු නොව වීරසිංහයන්ගේ මූලිකත්වයෙන් සුනිල් එදිරිසිංහයන් විසින් දොරට වැඩීමට නියමිත ගී සරණිය සුනිලුත් කලකට පෙර ගුවන් විදුලියට ගැයූ ගායනාවීම ඒ ගී විඳි සැමට තවත් එක් සතුටුදායක ආරංචියක් වනු ඇත.

''අද ඉපදෙන නැවුම් ලොවට සිව් දෙවියනි වරම් දෙන්න....''
ක්‍රි.පූ. 161 - 137 දී පමණ දුටුගැමුණු නරේන්ද්‍රයාණන් විසින් ඉන්දියාවේ රාම ග්‍රාමයෙන් වැඩම කළා යැයි කියනු ලබන සර්වඥ ධාතුන් වහන්සේ නිදන් කර තැනවූ ස්වර්ණමාලී මහා චෛත්‍යය, රුවන්වැලිසෑය, මහාථූපය, රත්නමාලි,



හේමමාලි යන නම්වලින් ද හැඳින්වේ. එතුමන් විසින් ම කළා වූ මිරිසවැටියේ තැන්පත් කර ඇත්තේ සධාතුක කුන්තායුධයකි. ක්‍රි.පූ. 250 210 දී පමණ දෙවන පෑ තිස් රජුන් විසින් තැනවූ බුදුරජාණන් වහන්සේගේ දකුණු අතුධාතුන් වහන්සේ තැන්පත් ථූපාරාමය ලංකාවේ පැරණිම චෛත්‍යය ලෙසින් සැළකෙයි. ඉහත කී දාගැබ් මෙන්ම සුදෝ සුදෙන් දිළිසෙන තවත් එක් දාගැබකි වළගම්බා (ක්‍රි.පූ. 89 - 77) නරපතියාණන් විසින් ඉදිකළ ලංකාරාමය. ලංකාර-ාම දාගැබ මෙන්ම ථූපාරාම දාගැබද වහලයකින් සෙවන වී තිබූ බවට සාක්ෂි දරන සෙල් ටැම් පුරාණ ඉදිකිරීම් ශිල්පයේ මහිම කියාපායි. ප්‍රතිසංස්කරණයන්ගෙන් පසුව සුදෝ සුදෙන් අහස් කුස සිපින මෙකී දාගැබ් බුබ්බුලාකාර, ඝඨාකාර හා ඝන්ඨාකාර හැඩයන්ගෙන් යුක්තයි.

වළගම්බා රජු විසින් ඉදිකරන ලදුව පසු කලෙක පණ්ඩුකාභය රජ දවස ප්‍රතිසංස්කරණය වූ අභයගිරි දාගැබ මහා ශ්‍රමදාන මාලාවක් සරණින් වර්තමානයේදීද ප්‍රතිසංස්කරණය වෙමින් තිබෙනු දැකීම සැදැහැතියන්ගේ නොමද සතුටට හේතුවකි. දහස් ගණනින් රැස් වූ බොදු දන අතින් අත යන ගඩොල් චෛත්‍ය ගර්භය දක්වා ගොස් අවැසි පරිදි තැන්පත්ව බදාමයෙන් බැඳෙයි. සංඝරත්නය පෙරදැරිව පුරුෂ පක්ෂය මතු නොව කාන්තාවන් පවා බැඳි පලංචි මත නැගගෙන මේ කරන ව්‍යායාමය දුටුවන්ගේ නෙත් තෙත් කරවන්නකි. එසේ වුවද පෞරාණික වටිනාකමකින් යුත් ''පද්මතියි'' මුරගල් දෙක වට තොට බැඳුණ කුඩා ආවරණ දෙක දේවාල කොටගත් පූසාරීන්ගේ සුවඳ දුම් කට්ට කුමංජල්වලින් ඒවාට වන හානිය අවබෝධ නොවීම නම් පුරාවස්තු අගයන්නන්ගේ කණගාටුවට හේතුවේ. මහසෙන් රජතුමන් විසින් (ක්‍රි.ව. 276 - 303) කරවූ ''දෙනා වෙහෙර'' නැතහොත් ජේතවන දාගැබ වූ කලී ශ්‍රී ලංකාවේ ඉදිකරන ලද දාගැබ් අතරින් විශාලතම දාගැබයි. එවකට අඩි 400 ක් උස් වූ මෙය දනට උස අඩි 232 කි.

දුටුගැමුණු නරපතියාණන් විසින් (ක්‍රි.පූ. 161 - 137) කරවූ ලෝවාමහාපාය අනුරාධපුර අටමස්ථානයේ ඉතිරි විෂ්මයයි. ශෛලමය ටැම් 40 පේලි 40 කින් යුතුව ටැම් 1600 ක් වූ මෙම නව මහල් ගොඩනැගිල්ලෙහි සෑම තට්ටුවක්ම කාමර 1000 කින් යුක්ත වී යැයි කියනු ලැබේ.

මහමෙව්නාව පුරා ඇවිදින කල හමුවන කුට්ටම්පොකුණ, සමාධි බුදුපිළිම වහන්සේ වැනි අපූරු නිමැවුම් අතරේ සැමතැනකම දැකිය හැකි වූ අනර්ඝ කැටයම් කලාවන් දෙකකි සඳකඩ පහණ සහ දොරටුපාල රූ සහිත මුරගල් ගොඩනැගිලි තැනීම ඇරඹුන මුල් කාලයේදීම (ක්‍රි.පූ. 3 සියවස) ආරම්භ වූ වකැයි සිතිය හැකි පියගැටපෙල නිර්මාණයේදී දෙපස අත්වැල ලෙසින් කොරවක් ගල් දෙකක්ද ඒ පාමුල මුරගල් දෙකක් ද මුදුනේ පුන් කළස් දෙකක්ද නෙලන ලදී. මුරගල් ඇතැම් විට කොරවක්ගල් නවතාලීම සඳහා කල ඉදිකිරීම් අංගයක්ද වන්නට ඇත. පියගැට පෙළෙහි අඩ කවාකාර පහතම පඩියයි සඳකඩපහණ. පරණවිතාන මහාචාර්යවරයාණන්ට අනුව පිටම කවයේ නෙලන ලද ''ගිනිදැල්ල'' කැටයමින් ලොවේ දුක් කරදරත්, දෙවන කවයේ දැක්වෙන ඇත්, ඇස්, සිංහ, ගව රූ පෙළින්' ජාති (ඉපදීම), ජරා (වියපත්වීම) ව්‍යාධි (ලෙඩ දුක්) මරණ යන සතරත්, අනතුරුව දැක්වෙන ''ලියවැල'' කැටයමින් තෘෂ්ණාවන්, ඊළඟට දැක්වෙන හංස පේළියෙන් දියෙන් කිරි වෙන්කර ගන්නා හංසයන් සේ දුසිරිත් අතහැර ධර්මය අනුගමනය කිරීමත් මධ්‍යයෙහි ඇති නෙළුමින් එසේ අනුගමනය කළ නිසාවෙන් සිතේ ඇතිවන පිරිසිදු බවත් හැඟවෙයි.

දොරටුව දෙසට ඇති අතෙහි පුන්කළසක් ද අනික් අතෙහි වල් විදුනාවක්ද දරන දොරටුපාල රූප රැගත් මුරගල් දකිනා විට සිහිපත්වන්නේ මහරගම යොවුන් රඟහලේ රන්වල බලකාය විසින් දර්ශන ගත කරවූ ''යුද්දෙටත් ඇවිත්'' ප්‍රසංගයේ දොරටු අරා සිටි දොරටු පාළයන්ය. රත්න ප්‍රාසාදය නමුත් හැඳින්වෙන අභයගිරි උපෝස්ථාගාරයේ පියගැට පෙළ පාමුල ඇති කලාත්මකම මුරගලෙහි මෙන් නොව මවුනක රැඳුනේ රජ දවස හෙල්ලයන්ය. හැඳ සිටියේ රජ දවස සෙබල ඇඳුම්ය. පැළඳ සිටියේ එදවස ආයිත්තම්ය. ශාලාවට ඇතුලු වන විටදී ඇසුරන් පිරිත් සජ්ජායනයකි. සංඝයා වහන්සේ කීප නමක් විසින් කැමැති අයගේ අතෙහි පිරිත් නූල් ගැට ගසනු දක්නට ලැබිණ. ප්‍රසංගය ඇරඹුණේ පංචශීලය සමාදන් වීමෙනි. ''රන්වල මතු පරපුර'' ළපැටියන්ගේ පෙරහැරකින් විවර වූ වේදිකාව හැඩගැන්විණ. ජාතික ඇඳුමින් විටින් විට අභිමානවත් විලාසයෙන් වේදිකාගත වූ තරුණයින් ''මොන කරුමයදෝ'' ගීතය ගයමින් අද සිංහලයා පත්වී ඇති අවාසනාවන්ත තත්ත්වය හුවා දැක්වූහ. රටේ වී ඇති සංස්කෘතිය පරිහාණියට එරෙහිව ''යුද්දෙටත් ඇවිත්'' ප්‍රසංගය යුද වැදී ඇත්තා සේය. ගායනය මතු නොව රංගනය, නර්තනය, වාදනය, කථනය, ජන ගායනා සහ ඒ පිළිබඳව දැනුම බෙදාහදා ගැනීම අතින් ඉතා ප්‍රශස්ත මට්ටමේ සිටින රන්වල බලකාය අප අතරින් වියෝ වුණ ලයනල් රන්වල මඟ ගත් සහන් රන්වල පෙරමුණ ගත් සෙබල මුලකි. එය සිංහල තාරුණ්‍ය පිළිබඳව අභිමානයකුත් සුභ අනාගතයක් පිළිබඳව මතු බලාපොරොත්තුත් ඇතිකරවන්නකි.

අනුරාධපුරයෙන් පිටවීමට කලින් සිහිපත් වූවෙකි. කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියාණන් රාජ්‍ය තන්ත්‍රයට අද දින බැඳී සිටියද තම වගකීම ඉටුකරමින් මෑතකදී රසිකයින් අතට පත් කළ ''තරු එළිය දිගේ'' ගීත සමුච්ඡය යහපත් වින්දනයක් පනත කාගේ වුව අගැයුමට ලක්වන්නකි. රත්න ශ්‍රී විජේසිංහ, යමුනා මාලනී, අනුරාධපුරයේ මහින්ද දිසානායක, සුනිල් ආර්. ගමගේ, සුනිල් දයානන්ද කෝනාර, ආචාර්ය අජන්තා රණසිංහ වැනි ප්‍රවීණයන් මෙන්මම නවීනයින් කිහිපදෙනෙකු අතින් ලියවුනු පබැඳුම් සංගීතවත් කොට ඇත්තේ, රෝහණ වීරසිංහ, ගුණදාස කපුගේ, සුනිල් දයානන්ද කෝනාර, අනුරාධපුරයේ කරුණාරත්න විජේවර්ධන, නවරත්න ගමගේ, එච්.එම්. ජයවර්ධන වැනි ප්‍රවීනයින් හා සුනේත්‍රා අත්දුන්න හා නන්ද සේන කටුවාවල නවකයින් අතිනි. මෙයට තමන් විසින් ම තනු තනා ගත් ගීත තුනක් ද ඇතුළත්වීම විශේෂත්වයකි.

ඒ සමඟින් සිහිපත් කළ යුතු තවත් අගනා ගී එකතුවකි දේවානන්ද වෛද්‍යසේකරයන්ගේ ''නීල නුවන්'' එතුමන්ගේ ''සතුට විලයි'', ''සඳ පායා සිනාසේවී'', ''ආශා දෑසින්'' වැනි රසවත් හරවත් ගීත ඊට ඇතුළත්ව ඇත්තේය.
''හරියට හීනයක් වගේ' පින් පන්ගේ ලියවිල්ල දිහා බලාගෙන ඉඳලා කිව්වේ ලොකු හුස්මක් හුළඟට යවන ගමන්.

''ඒක ඇත්ත. ඒත් ඒක හීනයක්ම නෙවෙයි කියලා දැනෙන්න මොනවා හරි කරලා ආවා නම් හරි. ඒ කියන්නෙ පැලයක් ඉන්දුවත් පස්සෙ දවසකදී අපි දැක්කෙ හීනයක් නෙවෙයි කියලා දැනෙනවානේ''
''ඒ අතින් පන්ට නම් දුක් වෙන්න දෙයක් නෑ'' පින් දුකෙන් වගේ කිව්වා.

''ඒ වගේ දේවල් මෙහෙත් කරන්න උත්සාහ කරන අය ඉන්නවා.'' පන් පින් අස්වැසුවා.අපේ දේ අගය කරන අය අප අතරත් නොවෙත්ද? නව ගීත නිර්මාණකරණය මව්බිමේ අයාලයේ යන වගක් පෙනුනද මෙරට අප උප සමාජ කුලකය අතරින් නැගෙන නිර්මාණයෝ එසේ නොවෙත්, සැප්තැම්බර් 22 දා කෙල්වොට්සන් රඟහලේ ''ගී සර - ගී රස'' ප්‍රසංගයේ දී එක්වන වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික ගායන ශිල්පී සංගමයේ ශිල්පීහු නැවුම් යමක් මෙපුර රසිකයනට පිදීමට සැදි පැහැදි සිටිත්. ''ස්කැට්ස්'' සංවිධානය විසින් සැප්තැම්බර් 9 වනදා ඉදිරිපත් කෙරෙන්නා වූ ''දහ අට සන්නිය'' ලක්දිව දකුණේ පැවැත්වෙන තොවිලයක සිරි ගනු ඇත. පාරම්පරික සැරසිලි මධ්‍යයේ ශාලාවෙන් පිටතත් ඇතුළතත් කෙරෙන්නා වූ මෙම ශාන්ති කර්මය පාරම්පරික ගුරුන්නාන්සේලා අතින් ඉටු කිරීමට නියමිතයි. අප උප සමාජ කුලකයේ ඇතැයි කියවෙන සියලුම යක්ෂ ප්‍රේත හා කුම්භාණ්ඩ දෝෂ එයින් දූරීභූත වේවා ය යන්න අපගේ අවංක පැතුමයි.


## පළමුවැනි තෑග්ග

කෙටි කතා සංග්‍රහය




තුසිත් අබේනායක
පද්මිණී තෝරකුඹුර
ශ්‍රියාණී පෙරේරා
මේනකා ජයතිලක
පද්මසිරි හේරත්
හැරිස් පරකන්දෙණිය
ර චන්ද්‍රසූරිය
සුභාෂිණී හේරත්
දමින්ද දම්පහලගේ
පුෂ්පිකා ගමගේ

2006 සන්නස සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහී කෙටි කතා එකතුව. දැන් කියවන්න.

පොතක මිල ඩොලර් 10 (තැපැල් ගාස්තු සමග)

Sannasa News Group
22 Lorne Street Lalor Vic 3075 Australia
Tel 613 9402 5380

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243